Sofia prokofiva - I Won't Apologize

මම සමාව ඉල්ලන්නේ නැහැ

කුරුලු පොත් - Kurulu poth

I Won't Apologize

මම සමාව ඉල්ලන්නේ නැහැ

සොෆියා ප්‍රොකොෆීවා

Sofia prokofieva

මම සමාව ඉල්ලන්නේ නැහැ - සොපියා ප්‍රොකොපීවා

අනුවාදය - රුසියන් - රසීයා බොම්රෝවා
අනුවාදය - සිංහල - අනඳපිය කුඩාතිහි

ප්‍රකාශනය

සීමාසහිත කුරුලු පොත් (පෞද්) සමාගම ©

මෙම අනුවාදයෙහි සියළු හිමිකම් ඇවිරිනි

ISBN 955-591-132-0

පළමුවැනි මුද්‍රණය 2005
දෙවැනි මුද්‍රණය 2008

පරිගණක අක්ෂර සංයෝජනය

කුරුලු පොත්

මුද්‍රණය

දර්ශන මාර්කටින් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
107, කඩුවෙල පාර, බත්තරමුල්ල.

ප්‍රකාශනය

සීමාසහිත කුරුලු පොත් (පෞද්) සමාගම.
594/1, නාවල පාර, රාජගිරිය.
දුරකථනය : 2863350

හැඳින්වීම

ජේ. කේ. රෝව්ලින් (J. K. Rowling) ගේ 'හැරී පෝටර් (Harry potter) නමැති ඉන්ද්‍රජාලික ළමා කතා අද ඉතා ජනප්‍රිය වී තිබේ. ඉන්ද්‍රජාලික සම්ප්‍රදායෙන් (magic realism) ළමයින්ට කතන්දර කීම ජන කතා සාහිත්‍යය තුළින් ප්‍රභවය වූවකි.

'හැරී පෝටර්' කර්තෘට මෙන් රුසියානු බසින් ඉන්ද්‍රජාලික කතන්දර කියන සොපියා ප්‍රොකොපීවා රුසියන් ළමයින්ගේ ආදරය දිනාගත් තවත් ඉන්ද්‍රජාලික කතන්දරකාරියක් වෙයි.

ඇයගේ කතන්දරවල විශේෂයක් වන්නේ ඒවා හුදෙක් අද්භූත රසයෙන් යුක්ත වීමටත් වඩා එයින් ළමා සිතට අපූරු සාරධාර්මික අශ්වාදයක් ලබා දෙන නිසාය.

ළමා පාඨකයාට 'මව් සෙනහස' ඉතාමත් මනෝවිද්‍යාත්මක ආකාරයෙන් හඳුනාගන්නට සලසන මෙම ඉන්ද්‍රජාලික කතන්දරය සොපියා ප්‍රොකොපීවා නමින් රුසියානු බසින් නිකුත් වී තිබේ. (1968)

රසියා බොබ්‌රෝවා (Raissa Bobroua) විසින් මෙම කෘතිය රුසියන් බසින් ඉංග්‍රීසි බසට අනුවාදය කරන ලද්දේ ය. 'කුරුලු පොත්' ප්‍රකාශකයන්ගේ ඇරයුමෙන් මෙම සිංහල අනුවාදය සංග්‍රහ කරන ලද්දේ අනඳපිය කුඩාතිහියන් විසිනි.

ප්‍රකාශකයෝ

එක කාලයක වස්යා නමැති පිරිමි ළමයෙක් සිටියා. ඒ ළමයාට සෙල්ලම් බඩු රාසියක් තිබුණා. ඒවා ඔහුගේ කාමරයේ හැම තැන ම දමා තිබුණා. ඇතැම් ඒවා තිබුණේ මේසය යට. අනෙක් ඒවා ඇඳුම් අල්මාරිය යටත් ඇඳ යටත් තිබුණා.

එක් දවසක උදේ වස්යාට තවත් සෙල්ලම් බඩුවක් ඕන වුණා. ඒ පැද්දෙන අශ්වයෙක්.

"පැද්දෙන අශ්වයෙක් මට ඕනෑ" යැයි වස්යා කිව්වා.

"පැද්දෙන අශ්වයෙක් මට ඕනෑ" යැයි වස්යා කෑගැසුවා.

"පැද්දෙන අශ්වයෙක් මට ඕනෑ" යැයි වස්යා ඇඬුවා. අඬා අඩි පොළොවේ හැප්පුවා. එය ඇසූ වස්යාගේ අම්මා "මට මේ දැන් සල්ලි හොයන්න බෑ. ටිකක් ඉවසන් ඉන්නැයි" ඔහුට කිව්වා.

"සල්ලි නැහැ!" වස්යා තරහෙන් මොරගැහුවා.

"සීනි ගන්නට සල්ලි තියෙනවා. මස් ගන්න සල්ලි තියෙනවා. අලවලට කෑමවලට සල්ලි තියෙනවා. ඒත් වුවමනා ම දේට අම්මා ළඟ සල්ලි නැහැ. ඔයා හරි ලෝබ ගෑණියෙක්. ඒ නිසයි එහෙම කියන්නේ."

ඒ මෙහොතේ ම සුළඟ තදින් හමා විත් ජනේලයක් ඇර දැමුවා. එයින් තද සීතලක් වස්යාගේ මුහුණට වැදුණා. රිදුම් දෙන හිම කැටි මේ සමඟ ම ආවා.

අම්මා ඉක්මනින් ජනේලය වසා දැමුවත් කාමරය පුරාමත් එළිමහනේත් මහ පාරේ වාගේ ම තද සීතලයි.

"පුතා! ඔයා නපුරු පිරිමි ළමයෙක්" යැයි කී අම්මා, " තමන්ගේ අම්මාට මේ වාගේ අකීකරු වීම ගැන ඔයා සමාව ගන්න ඕනෑ"යි කීවා.

"නැහැ මම සමාව ගන්නේ නැහැ." යි වස්යා ඇස්වල කඳුලු පිසදමමින් කීවා. එයා තමාගේ කබායත් හිස් වැස්මත් ඩැහැගෙන නිවසින් පිට වී දිවුවා.

වස්යා එළිමහනේ බංකුවක වාඩි වී සිටියා. තද හිම කැටි වැටෙමින් තිබුණා.

තමන්ගේ නගරයට මිදුණු හිම වැටී ඇති බව වස්යා දැන සිටියේ නැහැ. එසේ හිම වැටෙන්නේ පිරිමි ළමයකු හෝ ගැහැණු ළමයකු හෝ ඔවුන්ගේ අම්මා සමඟ රණ්ඩු වුණු විටයි. හිම දිගට ම වැටෙමින් තිබුණු අතර ඒ තරම් හිම අහසේ තිබෙන්නේ කොහොම දැයි වස්යා පුදුම වුණා.

වස්යා කල්පනා කරන්නට වුණා. "ඇයි මම සමාව ඉල්ලන්නේ? එය ඉවසන්න බැරි දෙයක්. මට හිතෙනවා ගෙදර නොගිහින් ඉන්න."

එහෙම හිතන්නට වූ වස්යා එතැන ම කනගාටුවෙන් වාඩිවී සිටියා. ඔහුට දැනුණේ තද සීතලත්, කනස්සල්ලත්. හදිසියේ ම ඔහු දුටුවා අරුම පුදුම නාකි මිනිහෙක් එළිමහනේ රවුම් ගසමින් දුවනවා. ඒ නාකි මිනිහා ඇඳගෙන සිටියේ උණුසුම් කබායක්. පැළඳගෙන සිටියේ උණුසුම් බූට් සපත්තු කුට්ටමක්. කල් ගිය බව පෙණුනු ලොම් හිස් වැස්මක් ද ඔහු පැළඳගෙන සිටියා. වස්සා එවැනි දේ කිසි දිනෙක දැකලා නැහැ.

"මේ මිනිහා මේ විදියට දුවන්නේ ඇයි." වස්යා කල්පනා කළා.

ඒත් ඔහු වහා ම තේරුම් ගත්තා. කළු බළලෙක් පිස්සුවෙන් වාගේ ඒ අතටත් මේ අතටත් දුවන අතර නාකි මිනිහා ඌ අල්ලා ගන්නට උත්සාහ කරනවා. නාකි මිනිහා එසේ දිවීම නිසා හොඳට ම හති වැටිලා සිටිනවා ඇතැ'යි සිතූ වස්යාට දුක හිතුණා. ඒ මදිවාට, ඒ කළු බළලා වස්යා පසුකර පිම්මේ දුවද්දී මොහොතක් නතර වී දිලිසෙන රෝස පාට දිවක් ඇදලා පෙන්නුවා.

"ඔබ මට විහිළු කරනවා ද?යි" වස්යා විස්මයට පත් වුණා.

බංකුවෙන් නැගිට ගත් ඔහු දිව ගොස් බළලාගේ පස්සා ගාත් දෙකෙන් පුදුම විදියට අල්ලා ගත්තා.

බළලා තෙමී තෙතබරි වී සිටි නමුත් වස්යා ඌ තදින් අල්ලා ගත්තා.



නාකි මිනිහා දුවගෙන ඇවිත් වස්යාගේ දෑතින් බළලා උදුරාගෙන ඔහුගේ කබායේ සාක්කුවේ දමා ගත්තා. වෙහෙස නිවී නැවත හුස්ම ගත් ඔහු ඉතා ම ආචාරශීලි ලෙස මෙහෙම කීවා.

"මේ බළලා අල්ලාගැනීමට උදවු කිරීම ගැන ඔබට බොහොම ස්තුතියි. මම එසේ මෙසේ නාකි මිනිහෙක් නොවේ. මම විජ්ජාකාරයෙක්. මේ බළලාටත් විජ්ජාකාර බලය තිබෙනවා. ඌට මන්ත්‍ර බල ඉගැන්වීමෙන් මම කෙළේ ලොකුම මෝඩකමක් යැයි සිතෙනවා. දැන් මූ මට කීකරු නැහැ. මූ කිසිම වැඩකට ඇති දෙයක් නොකරන අතර නොයෙක් දේවල් මීයන් බවට පත් කරනවා. ඌ මගේ ලියන මේසය මීයෙක් බවට පත්කරලා එය කෑවා. ඌ මගේ ඇඳ මීයෙක් බවට පත්කරලා එය ළිඳක් කළා. අද උදේ මගේ තට්ටු නිවාසයේ දෙර මීයෙක් බවට පත්කර එය ගිල දමා මහ පාරට දිවුවා. මම දැන් තීරණයකර සිටින්නේ අපේ ලොකු විජ්ජාකාරයාගෙන් උපදේශයක් ලබාගන්නයි."

ඒ වෙලාවේ බළලා විජ්ජාකාරයාගේ තුරුල්ලේ ගුලි ගැසී මුමුණන්නට පටන් ගත්තා.

"ඔබ කුමක් කළත් මම හැම දෙයක් ම මීයෙක් බවට පත්කරනවා" යැයි ඌ කීවා.

"හොඳයි. මම යන්න ඕනෑ" යි විජ්ජාකාරයා කනගාටුවෙන් කීවා. ඉන් පසු වස්යා දෙසට හැරුණු ඔහු වස්යාගේ කනට මෙසේ කෙදිරුවා.

"මූ මගේ ඔළුවට රිංගන්නට ඉස්සෙල්ලා මම ඉක්මන් වෙන්න ඕනෑ. එය ඉතාම කනගාටුදායක බව සත්තකින්ම කියන්න ඕනෑ."

වස්යාගේ හිසට තට්ටු කළ විජ්ජාකාරයා ගේට්ටුව ළඟට ගියා. හදිසියේ ම ආපසු හැරුණු ඔහු පෙරළා පැමිණුණා.

වස්යා ඇමැතු ඔහු මෙසේ කීවා. "මම ඔබට තදින් ම අවවාද කරනවා ගෙදර ගිහින් අම්මා සමග සමාදන වෙන්න කියා."

"මොන සමාදනයක් ද"යි වස්යා ගිගිරුවේය. "මට කොහෙත්ම බැහැ. එය දරාගන්න බැහැ."

"එහෙත් කෙනකුට අම්මා නැතිව ජීවත්වෙන්න බැහැ." යි විජ්ජාකාරයා කීවේය.

"ඇයි බැරි" වස්යා කොඳුරන්නට වූයේය. "මං ඊට වඩා හොඳ කෙනෙක් සොයාගන්න ඕනෑ"යි ද ඔහු කීවේය.

විජ්ජාකාරයා වස්යා දෙස කල්පනාකාරීව බලා සිටියේය.

"බොහොම හොඳයි" හෙමින් කී ඔහු "උත්සාහ කරලා බලන්න. ඔබට උදවු කරන්න පුළුවන් හැම දෙයක් ම මම කරන්නම්. එයින් සිදුවන්නේ කුමක් ද කියා අපි බලමු." යි ද කීවේය.

හිම තදින් ම ඇදෑවැටෙන්නට වූ බැවින් විජ්ජාකාරයා නොපෙනී ගියේය.

ඇත්ත ම කියනවා නම් වෙනත් අම්මා කෙනෙක් වස්යාට කිසිසේත් ම වුවමනා නැහැ.

එහෙත් සමාවක්? කිසිම දෙයකට සමාව ගන්න බැහැ.

වස්යා මිනිත්තු කිහිපයක් බංකුවේ වාඩි වී සිටියා. ඔහුගේ අත් සහ කකුල් තද සීතලෙන් හිරි වැටී තිබුණු අතර අනෙක් සියල්ලට ම වඩා තදින් සීතල වී තිබුණේ නාසයයි. ඇත්තම කියනවා නම්, නාසය සීතලෙන් බේරාගැනීමට අත්වැසුම් හෝ පාවහන් වැනි දෙයක් මිනිසුන් විසින් නිපදවා නැත.

එබැවින් ඔහුගේ නාසය ගෝවා දඬුවක් මෙන් හිරිවැටී තිබිණි. බංකුවෙන් බිමට බැස්ස වස්යා එළිමහනෙන් බැහැරට ගියේය. ඔහු ගේට්ටුව ළඟට යන විට ම කණුවේ එල්ලා තිබුණු ශබ්දවාහිනී යන්ත්‍රයට පණ ලැබිණි.

"සවන් දෙන්න. සවන් දෙන්න. මෙය අනතුරු ඇඟවන දැනුම් දීමක්."

ඒ සමඟ ම කුණාටුව තදින් හමා වින් පිස්සුවෙන් මෙන් කැරකී ශබ්දවාහිනී යන්ත්‍රයේ කළු මුඛය හිමෙන් වසා සිටියේය. එහි ශබ්දය එන්න එන්න ම අඩුවුණේය.

"සවන් දෙන්න. අනතුරු ඇඟවීමක්. යම් කෙනෙක් ඔහුගේ අම්මා සමඟ රණ්ඩු වෙලා. එය සිදුවෙලා තිබෙන්නේ අපේ නගරයේ. දැන් මිදුණු හිම අප දෙසට ඇවිත් තිබෙනවා. පුරවැසියනි, ඔබ ගේ නාස්, කන් සහ පයේ ඇඟිලි ආරක්ෂාකර ගන්න. දෙර ජනෙල් වසා තැබීමට සැලකිලිමත් වන්න. සවන් දෙන්න. සවන් දෙන්න..."

එහෙත් වස්සාට කිසිවක් ඇසෙන්නේ නැත. කණුවේ වාඩිවී සිටි කුරුලුගොයා වචන කිහිපයක් කතා කෙළේය. ඌ ඉතාම කලබල වී සිටියේය. යම් කිසි මැසිවිල්ලක් කොඳුරා නරක ආරංචිය තමාගේ භාර්යාවට කියන්නට ඌ පියාඹා ගියේය. උණුසුම් චිමිනිය අසලින් ඉවත් නොවන ලෙස ඇයට අනතුරු ඇඟවිය යුතුය. මිදුණු සීතල සෙල්ලමක් ලෙස ගණන් ගත යුත්තක් නොවේ.

3

වස්සා පාර දිගේ ඇවිදගෙන ගියේ හදිසියේ ම මේ වාගේ තද සීතලක් ඇති වුණේ කොහොම දැයි කල්පනා කරමින්ය. ඔහු ඊට කලින් දවසේ පිටතට ගියේ හිස් වැසුම වත් නොසලකාය. වීදිය කොනේ දී ඔහු අරුම පුදුම බල්ලෙකු දුටුවේය. උෆ කොට කකුල් සහ දිගු කන් ඇති බලු වර්ගයේ එකෙකි. ඉතා දිගු උෆ පෙනුණේ කකුල් හතරක් උඩ තිබෙන මහත ලිංගුස් කරලක් මෙනි. එවැනි දිග සතෙකුට කකුල් හතරක් පමණක් තිබීම මදි යැයි වස්යාට සිතුණි. අතරමැද තව පාද දෙකක් තිබුණා නම් හොඳ යැයි ඔහු සිතුවේය. ඒ බල්ලා රැහැනක ගැට ගසාගෙන අරන් ගියේ දුඹුරු පැහැති ලොමින් මසන ලද කබායක් ඇඳගත් ගැහැනියක් විසිනි. ඇය වස්යා පසුකරගෙන යද්දි, හදිසියේ ම මෙසේ කෙඳුරුවාය.

"ඔබ කැමති ද මා ඔබේ අම්මා වෙනවාට?"

ඇය දෙස බැලූ වස්යා ඇය හොඳ තැනැත්තියක් යැයි සිතුවා. වඩාත් ම වැදගත් වුණේ මේ අරුම පුදුම බල්ලා ඇය සතුව සිටීමයි.

ගැහැනියත් බල්ලාත් වස්යා කුමක් කියනවා දැයි අසන්නට බලා සිටියහ.

"හොඳයි, මට අම්මා කෙනෙකු සොයාගන්නවා නම් ඇයට බල්ලෙක් ද සිටීම වඩාත් හොඳයි." ඔහු එසේ සිතා, 'මම කැමති' යැයි කීවේය.

වස්යා එය පැවසුවේ ඉතා ම හෙමින් නිසා ඔහු එසේ කීවා දැයි සහතික ලෙසම හිතාගන්නට අපහසුයි. එහෙත් බිහිසුණු කුණාටුව ගිගුම් දෙමින් එක් වර ම හැමූ නිසා තද හිම වස්යා ගේ මුහුණට වැදුණි.

දුඹුරු පැහැති ලොම් කබාය තදින් දවටා ගත් ගැහැනිය වස්යා ගේ අත තදින් අල්ලා ගෙන වීදිය දිගේ හාවෙක් වාගේ දුවන්නට වුණා. ඈ එවිට මෙහෙම කිවුවා.

"මට ඔබ වැනි කුඩා පුතෙක් බොහෝ කාලෙක සිට වුවමනා වී තිබුණා. රැළි වැටුණු හිස කෙස් සහ මුක්කන් නාසය ඇති පුතෙක්."

ගැහැනියත්, දිග බල්ලාත් වස්සාත් ගෙදරකට ඇතුල් වුණා. ඒ අතර දරුණු කුණාටුවක් තදින් ම හමා ගියා. තරප්පු පෙළ ළඟ දරුණු සීතලක් තිබුණා. ගැහැනියත්, දිග බල්ලාත් වස්යාත් පඩි පෙළ දිගේ දුව ගොස් තට්ටු නිවාසවල පළමුවැනි මහලේ නිවාසයකට ඇතුල් වුණා.

"හානේ," යැයි දුඹුරු කබාය හැඳ සිටි ගැහැනිය කෑගසමින් ඇගේ දුඹුරු පැහැති කබායේ අත් වනමින්, " මම කොතරම් මෝඩද? ජනේලය වසන්නට මට අමතක වෙලා. මම කළේ කුමක් ද?" යි කීවාය.

සැබවින්ම කියනවා නම්, ඔවුන් ඇතුළු වූ කාමරය කාමරයක් ලෙස පෙනුණේ නැත. සෝපාව උඩ හිම කුට්ටියක් ද ඇඳුම් අල්මාරිය ළඟ තවත් කුට්ටියක් ද තිබුණා. මේසය උඩ හිම ගොඩගැසී තිබුණා. හිම කැට් සුළඟේ පාවෙමින් තිබුණා. දිග බල්ලා හිම මත බඩගාමින් කාමරයේ එහා මෙහා දුවන්නට වුණා.

"කමක් නැහැ පුතා"යි දුඹුරු කබායෙන් සැරසී සිටි ගැහැනිය කීවාය. අපි ඒවා ඉක්මනින් පිරිසිදු කරනවා යැයි ද කීවාය.

බාල්දිය සහ බේසම් කිහිපයක් රැගෙන ආ අතර ඔවුහු කාමරයෙන් හිම පිස දැමීමට පටන් ගත්හ. ඒවා මහ ගොඩක් තිබුණු නිසා ඔවුන් කොතරම් වෙහෙස වී වැඩකළත් ඒවා අඩුවන බවක් පෙනුණේ නැත. බාල්දි සහ බේසම් තදින් ම සීතල වී තිබුණු අතර වස්යාගේ අත් සැබවින් ම හිරි වැටී තිබිණි.

"අපට කවර දු වත් මේ කාමරය පිරිසිදු කරන්න ලැබෙන්නේ නැහැ. අප දෙදෙනාට මෙය කෙසේවත් කරන්න බැහැ." යි ඔහු කනගාටුවෙන් සිතුවේය. "මට අම්මලා එක්කෙනකුට වඩා වුවමනායි. අඩු කරමින් හතර දෙදෙනක් හෝ පස් දෙනෙක් වත් ඕනෑ."

ඔහු එසේ සිතන විට ම වාගේ දුඹුරු පැහැති ලොම් කබා හැඳගත් ගැහැනු හතර දෙනෙක් කාමරයට ඇතුල් වුණා. ඔවුනුත් හරියට ම පළමුවැන්නිය වාගේමයි. ඔවුන් කළයක තිබුණු 'පීස්' නමැති එළවළු ඇට මෙන් තෙමී සිටියා. වස්සා පුදුම වී බේසම බිම දැමුවා.

"ඇයි මේ සියලු ම අම්මලා තනි මට පමණක්? යැයි මවිත වූ ඔහු 'එහෙත් අම්මලා කීප දෙනෙක් සිටීම හොඳයි. ඇතැම් විට මා ඊට පුරුදුවෙන්න පුළුවන් යැයි සිතුවේය.

දුඹුරු පැහැති කබා හැඳගත් ගැහැනු හිම ඉක්මනින් ඉවත දමන්නට පටන් ගත්හ. එක් ගැහැනියක් ඒවා සෝපාව යටින් අතු ගෑ අතර තවත් ගැහැනියක් හිමකුරු හිම කණ්ඩිවලින් කඩා දැමුවාය. හිම කුට්ටි ඉතා ඉක්මනින් කුඩාවීමට පටන් ගත්තේ ය. දිග බල්ලාට කාමරය වටේ නිදහසේ දුවන්නට පුළුවන.

"එච්චරයි පොඩි පුතා" යැයි දුඹුරු පැහැති කබා හැඳගත් ගැහැණු එක් හඬින් කී අතර ඔවුහු වස්යා දෙස බලා සිනාසුණාහ.

"මෙහාට එන්න පොඩි පුතා, මම ඔයාට හාද්දක් දෙන්නම්" යැයි ඔහු අසලින් ම සිටි ගැහැනිය කීවාය.

"මෙහි එන්න පොඩි පුතා, මම ඔබේ මුහුණ පිසදමන්නම්" යැයි තවත් එකියක් කීවාය.

"පුතේ, ඔබට ඔබේ කොඩිලිවර් ඔයිල් අමතක වුණා ද"යි තුන්වැන්නිය ඇසුවාය.

"මා රාත්‍රී කෑම පිළියෙළ කරන තෙක් ඔබ බල්ලා සමඟ සෙල්ලම් කරන්නැයි" හතරවැන්නිය කීවාය.

"ඔබ ඔබේ රබර් සපත්තු ගලවා තබන්නැ"යි පස්වැන්නිය කීවා ය.

ඔවුන් සියල්ලෝම වස්යා අල්ලාගෙන තමන් වෙතට ඇදගැනීමට වෑයම් කළහ. වස්යාගේ කබාය මූට්ටුවලින් ලිහෙන්නට විය. ඒ අතර දිග බල්ලා දුකින් උඩුබුරලන්නට විය.

වස්යා ඔවුන් සියල්ලන්ගෙන් ම ගැලවී සාලාවට කඩාවැදුණේ ය. දුඹුරු කබා හැඳගත් ගැහැනු එකිනෙකාගේ ඇඟේ හැපෙමින් ඔහු පසුපස දිවූහ.

සාලාවේ දී වස්යා අල්ලාගත් ඔවුහු ඔහු වටකැරගෙන කතා කරන්නට වූහ. ඔවුන් කී දෙයින් වස්යා ඇසුණේ මෙයයි.

"බල්ලා බොන්න."

"වැස්සට පළඳින සපත්තු සමඟ සෙල්ලම් කරන්න"

"ඔබේ නාසය උගුල්ලා දමන්න."

"කොඩිලිවර් ඔයිල් ඉඹින්න."

වස්යා තම දෙකන් දැතින් වසාගෙන පහත මාලයට දුව ගොස් මහ හඬික් දෙර වසා දමා එතැනින් පිට වී ගියේය.

"නැහැ. ඔබට ස්තුතියි," ඔහු බියපත් ව කෙඳිරුවේය. "කෙනෙකුට අම්මාවරුන් බොහෝ දෙනකු වුවමනා නැහැ. කෙනකුට තමන්ගේ අම්මාට ආදරය කිරීම අවශ්‍යයි. එහෙත් බොහෝ දෙනකුට එක් වරට ආදරය කරන්න ඔබට පුළුවන්ද? එවිට ඔබ ඔවුන් සියලු දෙනාම පටලවා ගන්නවා. නැහැ. මට වුවමනා නැහැ...."

හදිසියේ ම සියල්ල නිසල විය. අසන්නට ලැබුණේ දෙර පිටුපසින් සිට ගෙන ප්‍රීතිමත් ගීයක් ගායනා කරන ගැහැනියකගේ හඬ පමණකි.



දරුණු කුණාටුවක් වීදිය වටා හමා යයි. වීදිය ඉතා දික්වූ අතර කුණාටුව ද දික්විය.

දරුණු කුණාටුව වස්යාගේ හිස් වැසුම ගලවා දමමින් ද, උතුරු සළුව කොනින් අදිමින් ද, කබාය කෙළවරින් අදිමින් ද වස්යාට විජ්ජා පෙන්වන්නට විය. අතුරු මාවතකට හැරුණු වස්යා එසේ කෙළේ එහි එතරම් සීතලක් නැතැයි සිතාගෙනය.

එහෙත් එය එසේ නොවුණේය. වස්යා මාවතේ කෙළවරින් හැරුණු මොහොතේ ම දරුණු කුණාටුව මහ හඬ නංවමින් හමා ආ අතර හිම සුළඟේ කැරකෙන්නට විය. පාරේ ගමන්කරන්නෝ තම කබායවල කොලර් ඔසොවාගෙන තමන් කරේ දවටාගෙන තිබුණු උතුරු සළුවලින් නාස් වසාගෙන ගමන් කළහ. එයින් සිදුවුණේ ඔවුන්ගේ නාස් සමචතුරශ්‍රයේ දී පටු තීරු බවට හැරීමයි. ඒ අතර ළමයි වේදනාවෙන් හඬමින් සීතලේ උඩ පැන්නෝය.

වස්යා දෙකට නැමී තම කබායේ අත්වල කෙළවරින් මුහුණ වසාගත්තේය. ඔහු එසේ කිසිවක් නොපෙනෙමින් ගමන් කළ අතර ඔහු අයිස් ක්‍රීම් විකුණන ගැහැනියකගේ

ඇඟේ හැප්පුණේය. ඇය වාඩි වී සිටියේ කුඩා රෝද උඩ සවිකැර තිබුණු මනහර නිල් පෙට්ටියක් උඩය.

"අයිස් ක්‍රීම්, අයිස් ක්‍රීම්" යැයි මිහිරි හඬින් ඈ කෑ ගසමින් සිටියා ය. "චොකලට්, ස්ට්‍රෝබරි, වැනිලා" යැයි ද ඈ කෑගැසුවාය.

ඇය දෙස බැලූ වස්යා ඇය ඉතා ලස්සන, කාරුණික මෙන් ම සතුටු සිතින් සිටින්නියකැයි සිතුවේය.

තමාගේ අම්මා ද තට්ටු නිවාසයේ ඇවිදිමින් 'අයිස් ක්‍රීම්, අයිස් ක්‍රීම්, චොකලට්, ස්ට්‍රෝබරී, වැනිලා" යැයි කෑගසනවා නම් මැනැවයි වස්යා කල්පනා කළේය.

අයිස්ක්‍රීම් වෙළෙන්දිය අසල වස්යා නතර වී සිටි නමුත් දරුණු කුණාටුව ඔහුගේ දෙපා අල්ලා ගෙන සිටී. ඒ කුණාටුව වස්යා වටා කැරකුණු අතර අයිස්ක්‍රීම් වෙළෙන්දිය රිදුම් දෙන හිම විසින් ග්‍රහණයට ගනු ලැබුවාය.

"දෙවියනේ" යැයි ඇය කෑගැසුවේ තම දෙ අත්වලට හුස්ම වැදීමෙන් ඒවා උණුසුම් වේ යැයි සිතමිනි. "මේ නපුරු සීතලේ මගේ අයිස්ක්‍රීම් වුවමනා වන්නේ කාටද?"

මඳ වේලාවක් කල්පනා කරමින් සිටි වස්යා ඔබ...මගේ...වත්තට.. කැමැති දැයි මිමිනුවේය.

"ඔබේ අම්මා?" යැයි ගැහැනිය කීවේ ඔහු එසේ කියන්නට සූදානමින් සිටි සෙයක් අඟවමින් ඉමහත් සතුටිනි. ඈ තම ඇඟිලි ඉරීම පවා නතර කළාය. "ඔව්, මම ඒකට හුගාක් කැමතියි. මේ මොහොතේ ම කැමැතියි."

උක්කුටකයෙන් හිඳගත් ගැහැනිය වස්යාගේ ඇස් දෙස ම බලා සිටියාය.

"ඒත්, ඔබට මා ඔබේ අම්මා වීමට වුවමනා වී තිබෙන්නේ අයිස්ක්‍රීම් නිසා නේ ද" යි ඈ ඇසුවාය.

"මම එයට කැමති නැහැ"

වස්යා ලජ්ජාවෙන් මුසපත් වී සිටියේය. ඇගෙන් ඈත්වූ ඔහු පැත්තකට හැරී එතැනින් පිට වී හිමෙන් වැසී තිබුණු වැටක් පසුකැරගෙන ගියේය.

"අයිස් ක්‍රීම්, චොකලට්, ස්ටෝබෙරි, වැනිලා" යන හඬ පසුපසින් ඇසුණේය.

ගැහැනියගේ හඬ ශෝකාලාපයක් වී ඇතැයි වස්යාට සිතිණි. ඈ දක්ෂ ගැහැනියකි. එබැවින් ඈ සියල්ල වටහාගෙන සිටිනවා.

"කිසිම කෙනෙකුට මේ වාගේ අම්මා කෙනකු තෝරාගන්නට බැහැ." වස්යා එසේ තීරණය කෙළේ ය.

"සීනි බෝල නිසා නොවෙයි. සිනමා උපක්‍රම නිසාත් නොවෙයි.... නමුත් කෙසේ වෙතත් මා ගෙදර යන්නේත් නැහැ. මා සමාව අයදින්නේත් නැහැ."

ඉතා තදින් හිම පතිත වන්නට පටන් ගත් බැවින් අවට කිසිවක් නොපෙනී ගියේය. වස්යාගේ කබාය සුදු පැහැ වුණේය. වස්යා මුළුමනින් ම සුදු පැහැ ගැන්වුණේය. වස්යාගේ ඇහි බැම ද ඇස් පිහාටු ද හිම විසින් ආලේප කරන ලදි.

වස්යා බොහෝ වේලාවක් නොනවත්වා ම ඇවිදගෙන ගියේය. නිමක් නැති වීදි සහ අතුරු මාවත් දිගේ ඔහු ඇවිදගෙන ගියේ ඒ කවර තැනක් දැයි නොදැනය.

"උණුසුම් වීම සඳහා මම නිවෙසට ඇතුළුවිය යුතුයැ" යි අන්තිමේ දී ඔහු කල්පනා කෙළේය.

පඩි පෙළක් උඩ හෝ සිටගෙන සිටිය හැකියැ යි වස්යා සිතුවේය.

එහෙත් ඔහුට කිසිම ගෙයක් නොපෙනිණි. ලොකු හිම කුට්ටි තමන් ඉදිරිපිට නටමින් තමාට හිස කැක්කුම ඇතිකරනවා යැයි ඔහුට සිතිණි. ඒ මදිවාට පින්න

නිසා ඔහුට මිනිත්තුවක්වත් නිසල ව සිටිය නොහැකි ය. තරමක උණුමක් ලබාගැනීම සඳහා වස්යා දුවන්නට විය.

ඔහු දිගට ම දුවගෙන ගිය අතර අන්තිමේ ලොකු ගසෙක හැපුණේය. ඔහු වටපිට බැලුවේ ය. ඔහු අවට හැම තැනම තිබුණේ සුදු පැහැති ගස්ය.



"මම අතරමංවෙලා" යැයි වස්යා මිමිණුවේය. "මේ වනාන්තරය කුමක් ද?" වනාන්තරයේ දී නගරයේදීටත් වඩා තද සීතල දැනෙයි. දරුණු කුණාටුව ඇදී ගියේ දැවැන්ත හිම කුට්ටි සමඟ ය. වස්යා ඉතා ම කුඩාය. හිම කුට්ටි ඉතා විශාලය.

ඔහු හිම කුට්ටි අතර කිසිදු අරමුණක් නැතිව ඔහු ඔබ මොබ ගමන් කෙළේය.

"නගරය තිබෙන්නේ මොන පැත්තේ දැයි" වස්යා කල්පනා කෙළේය. "මා ගමන් කරන්නේ ටිකෙන් ටික වනයේ ඇතින් ඇතට ම ද? තොරතුරක් අසන්නට කිසිවකු නැත. සිටින්නේ හිවලුන් සහ වලසුන් පමණය. මා ආපසු හැරී යා යුතුය. සමහර විට මගේ ම අඩිපාරවල් දිගේ ගොස් පිටවී යන්නට මට පුළුවන් වේවි."

නතරවුණු වස්යා වටපිට බලන්නට පටන් ගත්තේය. එහෙත් ඔහුගේ අඩි පාරවල්-පිය සටහන් පෙනෙන්නට නැත. දරුණු කුණාටුව ඒවා හිමෙන් වසා දමා තිබේ!.

සිටගෙන සිටීමෙනුත් සීතල වැඩිවෙයි. එහෙත් ඔහු දිගින් දිගට ම ගමන් කළ හොත් සීතල මුළුමනින්ම අතුරුදහන් වීය හැකිය.

වස්යා බියපත් වූයේය. බිය ඔහු තව තවත් සීතලට තල්ලු කෙළේය.

හදිසියේම රතු හිවල් ධේනුවක් හිම කණ්ඩියක් පිටුපස සිට පැමිණියාය.

ඈ සාමාන්‍ය හිවල් ධේනුවක් නොවන බව වස්යාට පෙනිණි. ඈ සතුන් වත්තක දී දකින්නට ලැබෙන වර්ගයේ හිවල් ධේනුවක් නොවේ.

ඇය වස්යා දෙස බැලූ අතර වස්යා හිවල් ධේනුව දෙස රවා බැලුවේය. ඇගේ ඇස්වල දිලිසීමක් පෙනිණි.

"හොඳ පුතෙකුට මම කැමැතියා"යි හදිසියේ ම ඈ කීවා ය. මම ඉතා හොඳ හිවල් ධේනුවක් වුවත් මට පුතෙක් නැහැ." ද ඈ කීවාය.

"හානේ, ඈ කතා කරනවා." වස්යා එසේ සිතුවේ පුදුමයට පත්වෙමිනි.

තද සීතලක් නොදැනෙන්නේ නම් ඔහුට වඩාත් පුදුමවන්නට තිබිණි. ඔහු සිටියේ හිමෙන් සීතල වී දරදඬු වීය. ඔහුගේ මවිතය කැටිගැසී මිදී තිබිණි.

ඒ අතර රතු වලස් ධේනුව ඇගේ ලස්සන වලිගයෙන් හිම අතුගාමින් ඔහු වටා ඇවිදිමින් සිටියාය. වරින් වර ඈ ඒ වලිගය දණ්ඩක් මෙන් අකුලා ලොම් අත් අග්ගිස්සක් මෙන් වැනුවාය. ඉන් පසු ඈ එය ඇගේ කර උඩ තබාගෙන සිටි අතර එය ලොම් කොලරයක් මෙන් පෙනිණි.

"මට පුතෙක් සිටියා නම්, මම ඔහුට ඉතා රසවත් තලප හදා දෙනවා" යැයි හිවල් ධේනුව පැත්තක් බලමින් කීවාය.

"මම ඇය සමඟ යනවා ද"යි වස්යා කල්පනා කෙළේ සීතලේ ගැහෙමින්ය. "මම උණුසුම් වූ පසු තලප ටිකක් කන්නම්."

ඔහු සිතන දේ සිවල් ඩෙනුව සිතනවා විය හැකිය.

"අන්න හරි. මගේ පොඩි එකා, මා එක්ක එන්න. අපි දර ටිකක් අහුලාගෙන මොහොතකින් ගෙදර යමු. ඔබ දෑත දිග හරින්න. මම ඒවාට දර පටවන්නම්. මෙන්න කොටන්, කෝටු, රිකිලි සහ ලී පතුරු..." වස්යාගේ දිග හැරගත් අත්වලට දර පටවන අතර හිවල් ඩෙනුව සින්දු කීවාය. ඇය වැඩියෙන් දර පැටැවූ අතර එහි බරට වස්යා දෙකට නැමුණේය. අන්තිම දර කෑල්ල ගත්තේ නිකටේ ආධාරයෙනි.

"එන්න පුතේ" යි හිවල් ඩෙනුව කීවාය. "ඔබ දර කෑලි බාගයක් දුර ගෙනයන්න. මම අනෙක් බාගය ගෙනයන්නම්." කී ඈ අර පෙනෙන බර්ච් ගස බලන්න. එතැන සිට හරියටම අඩ දුරයි තිබෙන්නේ"

අවසානයේ ඔවිහු බර්ච් ගස ළඟට පැමිණියහ.

"අනේ පුතේ, මට කනගාටුයි" යනුවෙන් හිවල් ඩෙනුව සුසුම් ලමින් කීවේ මෙතැන අඩ දුරක් නොවේ. මට වැරැදුණා. අප අඩ දුරක් යන්නේ අර පරණ ඕක් ගස ළඟට ගියාමයි. තව ටික දුරක් බර උසුලාගෙන යන්න."

වස්යා ඔක් ගස ළඟට ම දර ගෙන ගිය විට හිවල් ඩෙනුව මෙසේ කීවාය.

"නැහැ පුතේ, තව ම නැහැ. අඩ දුරක් වන්නේ අර පයින් ගස ළඟ දී. තව ටික දුරක් බර අදින්න."

ඔවුන් පයින් ගස ළඟට යන විට වස්යාට ඒ මහත් බර උසුලාගෙන සිටිය නොහැකි වූයේය. ඔහු දැරිය නොහැකි තරමට වෙහෙස වී සිටී අතර තමන්ගේ අත් දෙක ඒවායේ සන්ධිවලින් ගලැවී යනු ඇතැයි ඔහුට සිතිණි.

"මෙන්න මගේ නිවෙස" යැයි හිවල් ඩෙනුව කපටි ලෙස සිනාසෙමින් කීවාය.



එය සැබැවින් ම හිවල් නිවෙසකි. ගේ රතු පාටින් ආලේප කැර තිබිණි. එය තිබුණේ පයින් ගස යටය. එහි රතු දොරක් රතු වහලක් ද රතු ජනේල ද දුම් නළයක් ද තිබිණි.

"ඇයි ඔබ මා රැවැටුවේ" යැයි වස්යා කඳුළු පිරුණු දෙනෙතින් විමැසුවේය. ඔබ ඉල්ලා සිටියා නම් ඔබේ නිවෙස දක්වා මුළු මඟම මම දර ගෙනැත් දෙනවා."

හිවල් ධේනුව පැරැදුණු බැවින් ඈ තම නහය නිය තබා පිරිමැද්දය.

"මට සමාවන්න පුතේ. මම මින් පසු කිසි දවසක ඔබ රවටන්නේ නැහැ, එන්න ගේ ඇතුළට. අපි අර තලප උයමු."

දර කැබැලි ගොඩ ගෙය තුළට ඔසොවාගෙන ගිය වස්යා ඒවා ගිනි උඳුන අසලින් තැබුවේය.

හිවල් ධේනුවගේ ගෙය පැරැණි එකකි. දරුණු කුණාටුව විවරවලින් රිංගා හිම තට්ටු ඇතුළට දමා ඇත.

රතු කළයක තලප උයන්නට හිවල් ධේනුව පටන්ගත්තාය. ඉක්මනින් ම කිරි උතුරන්නට විය. තලප

පෙණ දමන්නට විය. එයින් මිහිරි සුවඳක් හමා ගියේය. ගෙය ඇතුළත උණුසුම් වී තිබිණි. ලොකු හැන්දක් අතට ගත් හිවල් ධේනුව හැලප ගොඩක් කරේ දමාගත්තාය. හැන්ද ලෙවකමින් ඇය කීවේ "නැහැ. තව ම එය සූදානම් නැහැ." කියා ය. තලප හැදි ගා රස බලා ඈ නැවත නැවතත් එහි රස බැලුවා ය. එහි රස බැලීම ඈ දිගට ම කළාය. ඒ හැම විට ම ඇය කීවේ එය තව ම හරියට පැසී නැති බවය.

කළයට එබී බැලූ වස්යාට දක්වනට ලැබුණේ එහි තලප කිසිවක් ඉතිරි වී නැති බවයි. හිවල් ධේනුව සියල්ල ම කා දමා තිබිණි. නැවැත වරක්. ලජ්ජාවට පැමිණි හිවල් ධේනුව ඇගේ වලිගයෙන් ඇගේ මුහුණ වසාගත්තාය.

"අනේ පුතේ, මම නැවත ඔබ රවටා තිබෙනවා. මට කරන්නට දෙයක් නැහැ. රැවැටීම මගේ දෙවැනි ස්වභාවයයි. මා ඉපැදී තිබෙන්නේ ඒ විදියටයි."

වස්යාගේ දෑසින් කදුළු කඩාවැටුණේය.

"ඔබට වුවමනා වී තිබෙනවා කවුරුන්ගේ හෝ අම්මා වීමට? ඔබ හිතනවා ද අම්මා කෙනෙකු වීම පහසු දෙයක් ය කියා.? අම්මා කිසි දවසෙක රවටන්නේ හෝ වංචා කරන්නේ හෝ නැහැ." වස්යා කීවේය.

"නැහැ" යි කනගාටුවෙන් පැවැසූ හිවල් ධේනුව "මට එසේ වීමට හැකිවේ යැයි මා හිතන්නේ නැහැ."

නිවෙසින් දුව ගිය වස්යා එහි පඩි පෙළින් ද හිමෙන් නොවැසුණු පාර දිගේ ද වේගයෙන් දිව ගියේය.

"මම කොතරම් මෝඩයෙක් ද"යි සිතූ ඔහු මට වෙනත් අම්මා කෙනෙකු හමු නොවන බව මම හොඳින් දනගත්තා. වෙනත් අම්මා කෙනකුට මා කිසි දවසෙක පුරුදු වන්නේ නැහැ. එහෙත් මම සමාව අයදින්නෙත් නැහැ. මම තනියම ජීවත්වෙනවා."

දරුණු කුණාටුව මුරගාන්නටත් කෙදිරිලි ගාන්නටත් පටන් ගත්තේ වස්යා බිය ගැන්වීමටය. සැබවින්ම එය බිහිසුණුය. එහි දී කිසිවක් කතාකරන්නට වස්යාට නොහැකි විය.

"ඌ උක උක උක" යැයි දරුණු කුණාටුව කීවා. "ප්ස්ස්ස්ට්"

වස්යා කුණාටුවට එරෙහිව දෙගුණයකින් සූදානම් වූයේය. කමිසයේ කොලරය උස්කෙළේය. තම කමිසයේ අත් හැකුළුවේය. හදිසියේ ම ගස්වල අතු කැඩෙන්නට විය. ලොකු කන්දක් ලොකු පාද තබමින් පඳුරුවලින් මතු වී ඇවිදින්නට විය. වස්යා එය එක් වරටම හඳුනා ගත්තේය. ඒ වලස් ධේනුවකි.

"ඔබ අම්මා කෙනෙකු සොයනවා ද"යි වලස් ධේනුව මහ හඬින් ඇසුවාය.

වස්යා තම දත් සැලෙද්දී "නැහැ. නැහැ." යි කීවේය. "මට අම්මා කෙනෙක් ඉන්නවා. මට ඉන්නවා."

"ඔබ මා සමඟ වාසය කැර මගේ පුතා නොවන්නේ ඇයි? මගේ තට්ටු නිවාසය මට ලොකු වැඩියි! මට එහි තනියක් දැනෙනවා."

"ඔබේ පුතා නොවී මට එහි පැමිණිය හැකි ද?" වස්යා එසේ මිමිනුවේය.

"එහෙනම් ඉතා හොඳයි, වලස් ධේනුව එකඟවූවාය. මම ඔබට රාත්‍රී භෝජනය දී ඔබ නිදි කරවන්නම්."

ඉන් පසු වස්යා වලස් ධේනුව පසුපස ගියේය.

"මගේ අඩි පාරේ ගමන් කරන්න. එවිට ගමන පහසු වේවි." යි ඈ කීවාය.

එහෙත් ඇගේ අඩි පාරවල් අඩි පනහක් තරම් ගැඹුරුයි. වස්යා එයින් එකකට අඩිය තැබූ විට ඔහුගේ කකුල කලව දක්වා එරුණේය.

"මෙන්න මගේ ගෙදර" යි වලස් ධේනුව අන්තිමේ දී පැවසුවා ය.

වටපිට බැලූ වස්යාට කිසි ම ගෙයක් දකින්නට නොලැබිණි. ඔහු ඉදිරියෙන් පෙනුනේ පොළොව යටට විහිදුණු කළු හිලක් සහිත හිම කණ්ඩියකි. දැන් ඉතින් මොනවා කරන්නද?. එබැවින් වලස් ධේනුව පසුපසින් වස්යා බඩගාගෙන ගියේය.

"මෙන්න ඉස්තෝප්පුව" යැයි ඈ කීවාය. "මේ තිබෙන්නේ මගේ කාමරය. ඇතුළට එන්න. ලජ්ජා වෙන්න එපා."

තමාගේ කබායේ බොත්තම් තදකැරගත් වස්යා බිම ඇන තබා ගත්තේය. ලොකු පාන් කුට්ටියක් කැපූ වලස් ධේනුව එය මතුපිට රතුන් මීපැණි ඇතුරුවාය.



මී පැණි පාන් වලින් පිටතට ගලා ගියේය. වස්යා එක් පැත්තකින් විකන විට මී පැණි අනෙක් පැත්තෙන් බේරී ගියේය. එබැවින් ඔහුට සිදු වුණේ ඉක්මනින් ඒවා ලෙවකන්නටය.

වලස් ධේනුව හාන්සි වී සිටි අතර ඇගේ ලොමින් පිරුණු පිටුපස බිත්තිය දෙසට හරවාගෙන ඈනුම් හරිමින් සිටියාය.

"උෆ උක උක" යි කී ඈ මේ අවුරුද්දේ ශීත සෘතුව කලින් පැමිණියේ "යැයි කීවාය.

ඇය ඇගේ කට මුළුමනින් ම විවර කළ අතර විශාල දත් සහ කෑම බොක්ක දුටු වස්යා බියවූයේය.

වස්යා බියට පත්ව සිටින බව දුටු වලස් ධේනුව ඈනුම අරින විට මුව වසාගන්නට පටන් ගත්තාය. ඈ හොඳ එකියකි. ඈ උපක්‍රමශීලිය. කාරුණිකය.

වස්යා පාන් සහ මීපැණිවලින් සප්පයම් වූයේය. ඔහුගේ අත් මිදී තිබුණු අතර ඇස් අරින්නට නොහැකිව තිබිණි. එසේ වූයේ මිදුණු මීපැණි නිසා හෝ ඔහු නිදිමතින් සිටි නිසා විය හැකිය.

වලස් ධේනුව දෙස බලා සිටි ඔහු අන්තිමේ දී ඈනුම් අරින්නට විය.

හදිසියේ ම ඇලයට හැරුණු වලස් ධේනුව ගොරවන්නට පටන් ගත්තාය. ඈ දැන් තද නින්දේය. නැවත ඇය පෙනුණේ ලොම් සහිත කන්දක් ලෙසය. එහි පෙරපස කුමක් ද පසුපස කුමක් දැයි කෙනෙකුට කිව නොහැකියි.

"නැගිටින්න වලස් ධේනුව" යි වස්යා බියෙන් හැඬුවේය. "මම මෙතැන තනියම මොනවා කරන්නද?"

"මොකක්ද කීවේ"යි නිදිමතින් ම වලස් ධේනුව විමැසුවාය.

"ඇයි? නිදගන්න. දැන් අපි බොහෝ වේලාවක් නිදා ගන්නවා. වසන්ත කාලය එන තුරු ම නිදාගන්නවා." එසේ පැවසූ වලස් ධේනුව නැවැත ගොරවන්නට වූවාය.

"වසන්තය එනතුරුම යැයි ඔබ අදහස් කෙළේ කුමක්ද?" වස්යා බියෙන් කෑගැසුවේය. "මට ඒ තරම් නිදගන්න බැහැ!"

ඔහු වලස් ධේනුවගේ ලොම් සහිත පැත්තට අතින් ඇන්නේය. එහෙත් ඈ මඳකින්වත් නොසෙල්වී සිටියාය.

වස්යා අවලාද වශයෙන් මෙසේ කීවේය. "බලන්න. අම්මා මා හැම වේලාවේ ම කලින් නිදි කරවනවා. ඇය නිදන්නට යන්නේ ඉන් පසුවයි. ඈ ශීත ඍතුව පුරා ම නිදාගන්නේ නැහැ."

වස්යා නිදාගෙන සිටින වලස් ධේනුව ළඟ වාඩි වී සිටීම අත්හළේය.

"මට මේ වාගේ වසන්තය තෙක් වාඩි වී සිටින්නට බැහැ." යි ඔහු තමාට ම කියාගත්තේය. ඉන් පසු ඔහු වලස් ගුහාවෙන් බඩගාගෙන පිටතට ගියේය.





6

වී වන විට වනාන්තරයට රාත්‍රී කාලය පැමිණ තිබිණි. හිම් කණ්ඩි ඉතා විශාල වූ අතර ඒවා පෙනුණේ තද කළු පැහැයෙනි.

වස්යා ගැඹුරු හිම පතනයේ ඔහුගේ ඉඟ දක්වා එරුණේය. ඔහු ගොඩට පැමිණියේ ඉතාම අමාරුවෙනි. ඒ වන විට වස්යාගේ රබර් සපත්තු ගැලවී ගිහින්ය. එසේ වූයේ හිම කුට්ටි ඒවා ඩැහැගෙන සඟවා ගෙන තිබුණු බැවිනි. වස්යා ඒ රබර් සපත්තු සොයා හිම කැටි ඇවිස්සුවේය. එහෙත් සිදුවුණේ කුමක්ද? ඔහුගේ අත් මේස් ද හිම කුට්ටි විසින් සඟවා ගැනීමයි!

වස්යා මේ වන විට සිටියේ බෙහෙවින් කරදරකාරීවය. ඔහු හිම අතරින් ගොස් ඉතා උස දේවදූර ගසකට නැග්ගේය.

ඔහු දේවදූර ගස අමතා මෙසේ කීවේය. "මගේ අම්මාත් නැතිව මම වනාන්තරයේ තනිවම ඉන්නවා! අනේ, දේවදූර මා ඔබේ අතුවලින් ආවරණයකැර ගන්න."

පැරණි දේවදූර ගස තම අතුපතර හඬ නංවමින් එසවූ අතර වස්යා ඒවා අතරට රිංගා ගසේ කඳට පිට තදකැර ගත්තේය. ඒ තුළ ඔහු ගුළි ගැසී බෝලයක් මෙන් සිටියේය. දේවදූර ගස එහි සන අතු නමා වස්යා අවාරණයකැර ගත්තාය.

"ඔබේ කටු කොතරම් වේදනාව ගෙන දෙනවා ද"යි වස්යා කෙඳිරුවේය. "අම්මාට නම් ඔබ වගේ කටු නැහැ."

එහෙත් මිදුණු සීතල වස්යා අතහැර ඉවත්ව යන පාටක් නැත! ඔහු සීතල දේවදර ගස යටින් රිංගා එහි අතු අතරට වැදුණේය.



දේවදර ගස නළා රාශියක් තිබෙන අයුරින් ගුම් නද දුන්නේය.

"කවුරු හරි කතා කරනවාද?"යි වස්යා පුදුමයට පත්විය.

දේවදර ගස නැවත වරක් කුංච නාද කෙළේය.

හදිසියේ ම ගසේ අතු නැමී ගැලැවී ගියේය. ඉන් පසු කිසි වෙක් වස්යාගේ මුහුණට උණුසුම් හුස්මක් පිට කෙළේය. එවිට අශ්ව ධේනුවකගේ ලොකු හිසක් දුක්බර නෙතත් ඔහු වෙත එල්ලකැර තිබෙන බව වස්යා දුටුවේය.

"අනේ මට තදින් ම සීතලයි" යනුවෙන් වස්යා කෙඳිරුවේය. "නැවත වරක් මට පිඹින්නැ"යි ද ඔහු අයැද සිටියේය.

"ඔබ අයහපත් තත්වයක සිටිනවා ළමයෝ, දැන් කළ යුතු හොඳම දෙය ඔය සිටින තැනින් බඩ ගාගෙන ඇවිත්

මගේ පිට උඩට නැඟීමයි." යනුයෙන් අශ්ව ධේනුව දුකින් කීවාය.

වස්යා තද සීතලෙන් වෙවුලමින් සිටි බැවින් අශ්ව ධේනුවගේ පිට උඩ නැගීමට ඔහුට බොහෝ වේලාවක් ගත විය.

අශ්ව ධේනුවගේ කෙසුරුවල එල්ලුණු වස්යා තම හිස එහි සඟවාගෙන ඇස් පියා ගත්තේය. අශ්ව ධේනුව ඇගේ නිවෙසට පැමිණියාය. දෙර ළඟට පැමිණි ඈ ඊළඟට කාමරයට ගියාය.

ඇගේ නිවෙස විශාල ශක්තිමත් එකක් විය. එහෙත් එය හිස්ය. එහි ගෘහභාණ්ඩ කිසිවක් නොවූ අතර එක කොනෙක පිදුරු ගොඩක් තිබිණි. අශ්ව ධේනුව දෙස බැලූ වස්යා ඇය වයස්ගත බවත් දුකෙන් සිටින බවත් දුටුවේය. ඇගේ ඇස් දුක්බරය. ඇගේ නළලේ දුක්බර සුදු කැළලක් ද තිබිණි.

"ඔබට බඩගිනිද?" යි අශ්ව ධේනුව ඇසුවාය.

"මට බඩගිනියි." වස්යා පිළිතුරු දුන්නේය.

පිදුරු ගොඩ උඩ ඇඳක් පිළියෙළ කළ අශ්ව ධේනුව වස්යා පැරණි අශ්ව රෙද්දකින් වසා තැබුවාය. එහෙත් ඔහුට උණුසුමක් නොදැනුණේය.

ඔහු මෙසේ කීය. "අශ්වයන් වනාන්තරයේ ජීවත්වන බවක් මා දැන සිටියේ නැහැ."

අශ්ව ධේනුව දුකින් හිස සැලුවාය.

"මා සමූහ ගොවිපළක ජීවත් වෙලා තිබෙනවා." යැයි ඈ කීවා ය. "එහෙත් ඒ ගොවිපළ ට්‍රැක්ටරයක් මිල දී ගත්තා. ඉන් පසු එතැනට මා එපා වුණා. ඉන් පසු නගරයට ගිය මා බේකරියක රැකියාවක් ලබා ගත්තා. බේකරියේ සාප්පුවලට පාන් සහ රස රෝල්ස් මා ගෙන ගියා. එහෙත්

බේකරියේ මැනේජර් ලොරියක් මිල දී ගත්තා. එහි දී මා දැනගත්තා ඔහුට මා වුවමනා නැති බව. ඉන් පසු මා කැලේට ගිහින් මේ ගෙය හදාගෙන මෙහි පදිංචි වුණා. නමුත් මා ළඟදී ම මැරෙන්න පුළුවන්. ඔබ කිසිවකුට වුවමනා නොවූ විට ජීවත්වීමේ තේරුමක් තිබෙනවාද?"

"එහෙමනම් මා වුවමනා කාට ද?"යි වස්යා සිතුවේය. "අම්මාට මා වුවමනායි!"

අශ්ව ධේනුව ඉවත බලාගත්තාය. ඇතැම් විට වස්යා තමාගේ දුක්මුසු ඇස් දෙස බලනවාට ඇය කැමැති නැතිවා වන්නට පිළිවන.

"කිසිවෙක් මා බලාපොරොත්තුවෙන් සිටින්නේ නැහැ.. කිසිවෙක් මා ගැන සිතන්නේ නැහැ... කිසිවෙකුට මා ගැන කනස්සල්ලක් නැහැ." අශ්ව ධේනුව දුක්මුසුව සුසුම් හෙළමින් කීවාය.

"අම්මා මා ගැන කනස්සල්ලෙන් සිටිනවා ඇති" යි වස්යා සිතුවේය. ඇත්තට ම ඇය කනස්සල්ලෙන් ඇති. මා කොයිබ සිටිනවා දැයි ඈ දන්නේ නැහැ. අම්මා දුකින් සිහි විකල් වී සිටිනවා ඇති. මගේ අම්මා!"

"අශ්ව ධේනුව, මගේ ආරණ්‍යය අශ්ව ධේනුව" යැයි වස්යා කඳුළු සලමින් කීවේය. කරුණාකර මා ගෙදර ගෙනියන්න. ඔබට හැකි තරම් වේගයෙන් මා මගේ අම්මා ළඟට ගෙන යන්න. මගේ අම්මා දුකින් සිටිනවා!"

ජනේලයෙන් පිටත බැලූ අශ්ව ධේනුව හිස සැලුවාය.

"බලන්න මේ හිම කුණාටුව. කුණාටුව හමනවා බලන්න. මේ වගේ දරුණු රාත්‍රියක් අපේ වනාන්තරයේ මා දැක නැහැ! ඔබ හිමෙන් මීදී මැරේවි. මට ඔබ පණ පිටින් ගෙනයන්න බැරිවේවි. අපි හෙට උදේ වන තෙක් ඉඳිමුද?"

"බැහැ. මා අද ම යා යුතුයි. දැන් ම යා යුතුයි." කියමින් වස්යා ඇඬුවේය. " අම්මා දුකින් ඇති!"



"හොඳයි, අඬන්න එපා. " අශ්ව ධේනුව කීවාය. ඔබට තදින් ම වුවමනා නම්, එතරම් ම වැදගත් නම් මම ඔබේ අම්මා ළඟට ඔබ ගෙන යන්නම්."

වස්යා අශ්ව ධේනුවගේ පිට උඩට නැඟුණේය. ඈ පඩි පෙළ බැස්සේ ඉතා ම පරිස්සමින්ය.

හිම පතනය සහිත කුණාටුව ඔවුන් ඉදිරියට කඩාවැදුණේය. එය මහ හඬ නැඟුවේය. ඔවුන් වටකැර ගත්තේය.

එය සුළි නංවමින් ඔවුන්ගේ ඇස්වලට කඩා පැන්නේය. වරක් දකුණු පැත්තෙන් ද තවත් වරක් වම් පැත්තෙන් ද එය හමා ගියේය. එයින් බේරී වනාන්තරයෙන් පිටවී යන්නට ඔවුනට නුපුළුවන. අශ්ව ධේනුව ඉතා සෙමෙන් ගමන් කෙළේ පැද්දෙමින් ද පටලැවෙමින්දය.

"අශ්ව ධේනුව, ඔබට කුමක් සිදුවුණා ද"යි වස්යා ඇසුවේය. "මා හිතුවේ කිසිවකුට මා වුවමනා නැති වෙලාය කියා" යැයි අශ්ව ධේනුව කීවාය.

"ඒත් ඒක වැරැදියි අශ්ව ධේනුව" වස්යා කීවේය. "ඔබ වුවමනායි. ඔබ හොඳට ම වුවමනායි. මට ඔබ වුවමනායි! ඔබ නොසිටියා නම් මේ වනාන්තරයේ දී මා හිමෙන් මිදී මියයන්නට තිබුණා. මට ඔබ මගේ අම්මා කැරගන්නට බැහැ. ඒ මට අම්මා කෙනෙකු සිටින නිසායි. මා මගේ අම්මාට ආදරෙයි. ඔබ හැමදෑක ම මාගේ හොඳම මිතුරියයි"

අශ්ව ධේනුව හැල්මේ දුවන්නට පටන් ගත්තා. ඒ වස්යාගේ වචන ඇය දිරිගැන්වූ නිසා බව නිසැකයි.

ඈ නගරයට ළඟාවූවාය.

නගරයේ නිවාසවල ජනේල සියල්ල ම අඳුරුය. ඒ සියලු ම ළමයින් ඔවුන්ගේ අම්මලා ද නිදාගෙන සිටි බැවිනි.

ඒත් වීදියක දී විජ්ජාකාරයා දුබල පා තබමින් කළු බළලා වඩාගෙන පයින් ම යනවා වස්යා දුටුවේය.

ඔවුන් දුටු විජ්ජාකාරයා ඉමහත් සතුටට පත්වුණේය.

"නවතින්න. නවතින්නැයි" ඔහු කෑගැසුවේය. "සියලු ම ට්‍රෑම් කාර් ඒවායේ පිට්ටනිවල නිදි. සේරම ට්‍රොලි බසුත් නතරවෙලා. අපි යන්නෙත් ඒ පළාතට. අපට ඉඩක් දෙන්න.

"හොඳයි එන්නැ"යි අශ්ව ධේනුව කීවාය.

විජ්ජාකාරයා ඇගේ පිට උඩ නැග වස්යාට පිටුපසින් වාඩිවූයේ ඔහුගේ අත එක අතකින් අල්ලාගෙනය.

"ඔබ යන්නේ ඔබේ අම්මාගේ ගෙදරටද"යි විජ්ජාකාරයා ඇසුවේය.

"ඔව්" යැයි වස්යා පිළිතුරු දුන්නේය.

ඒ වෙලාව වන විට ඉතා උණුසුම් වටපිටාවක් පවතින බව ඔහු දුටුවේය. දරුණු කුණාටුව හැමීම නැවතී තිබිණි. හිම දිය වී සිය ගණන් කුඩා දිය පාරවල් හැම පැත්තෙන් ම මුමුනනවා අසන්නට ලැබිණි.

"වැඩිහිටි විජ්ජාකාරයා ඔබට උදව් කළා ද"යි වස්යා ඇසුවේය.

"ඔව්" යැයි පිළිතුරු දුන් විජ්ජාකාරයා, "ඒ සියල්ල ඉතා සුළු දේවල් බව ඔප්පුවුණා. ඇත්ත වශයෙන් ම මා එය සිතා බැලිය යුතුව තිබුණා. වැඩිහිටි විජ්ජාකාරයාත් මමත් මහල් නිවාසයේ සියලු ම දේ මීයන් බවට පත් කළා. ඒ මීයන් මගේ බළලාට පහර දුන්නා. තේ පෝච්චි මීයා නටන උණු වතුර උගේ ඇඟට වත්කළා. දුහුවිලි ආදිය පිරිසිදු කරන මීයා උගේ ලොම් අදින්නට පටන් ගත්තා. සමතලා යකඩ මීයා උගේ වලිගය උඩ වාඩිවුණා. ලුණු විකුණන මීයා ඌට ලුණු ඉස්සා. ළමා බුරුසු මීයා උගේ දත් සුද්ද කරන්න පටන්ගත්තා. ඔවුන් ඔහු පිස්සෙක් කළා. නැවත කිසි දවසක යම් යම් දේවල් මීයන් බවට හැරවීම අත්හරින බවට ඔහු පොරොන්දු වුණා. යම් කිසිවකු තදින් ම ඉල්ලා සිටියොත් හැර එසේ නොකරන බවට ඔහු ගිවිසුම් දුන්නා."

"එහෙනම් මා යම් කිසි ප්‍රයෝජනවත් දෙයකට හරවන්නට ඔබට පුළුවන් වේවි."යි අශ්ව ධේනුව දුක්මුසුව ඇසුවාය.

"මීයකු බවට පත්කරන්නද"යි බළලා උනන්දුවෙන් ඇසුවේය. "ඇතැම් අශ්වයන්ට මීයන්ගේ ම පාට තිබෙනවා."

"නැහැ. මට වුවමනා නැහැ මීයකු වන්නට" යැයි අශ්ව ධේනුව කනගාටුවෙන් කීවාය.

ඉන් පසු ඔවුහු බොහෝ වේලාවක් නිහඬව ගමන් කළහ. මහන්සි වී සිටි වස්යා විජ්ජාකාරයාගේ පපුවට හේත්තු වුණේය.

එක් ජනේලයක එළියක් තිබෙනු ඔහු හදිසියේ ම දුටුවේය. ඒ වස්යාගේ අම්මාගේ නිවෙසය. ආලෝකය පෙනුණේ වස්යාගේ කාමරයෙනි. ඔහු අශ්ව ධේනුවගේ පිට උඩින් බිමට බැස ඇගේ ගෙල සිඹිමින් ඇගේ කනට කෙඳිරුවේය.

"කරුණාකැර පිටත යන්න එපා. මම මොහොතකින් එන්නම්." කියමින් ඔහු නිවෙසට දිවුවේය.

අම්මා දෙර ඇරියාය. ඇය බෙහෙවින් සුදුමැලි වී සිටි අතර ඇගේ ඇස් රතු පැහැ ගැන්වී තිබිණි.

"ඔබ මෙතරම් කාලයක් ගිහින් සිටියේ කොයිබද"යි ඈ විමැසුවා ය. වස්යා මං සිටියේ හරි ම දුකෙන්. ඇත්තටම."

වස්යා ඇගේ දෑතට පැන අඬන්නට විය.

"අම්මේ, කරුණාකැර මට සමාව දෙන්න."

එය පහසුවෙන් ම ලැබෙන බව ඔහුට පෙනිණි. සමාව දීමක් සමාව ඉල්ලා සිටීමත් ඉතා පහසුයි. එය සැබැවින් ම පහසු ද මනහර ද සුවපහසු ද වෙයි.

අම්මා විසින් වස්යා සිප ගනු ලැබූ අතර ඔහු උණුසුම් විය හැකි පමණට ම උණුසුම් වූයේය. එසේ වූයේ ඒ වේලාව වන විට මිදුණු හිම නගරය අතහැර ගොස් සිටි බැවිනි.

"අම්මේ" යි කී වස්යා, 'මම ඉතා හොඳ අශ්ව ධේනුවක් මිදුලේ නතරකැර ආවා. ඈ මගේ මිතුරියයි. ඇය මෙහි ගෙන එන්නට අවසර දෙනවාද?"

"ඇත්තට ම", අම්මා කීවාය.

"ඇයට අප සමඟ ජීවත් වන්නට කියමු."

"ඉතාම හොඳයි. අම්මා කීවාය. එහෙත් ඇය මෙහි සිටින්නට කැමැති වේදැයි මා දන්නේ නැහැ. ඇත්තට ම ඇයට පිදුරු සහ ධාන්‍ය ලබාදීම මට කරන්න පුළුවනි. එහෙත් ඇය ඔසොවනයෙන් -ලිෆ්ට් එකෙන් යන්න කැමැති වේවි ද? තරප්පු පේළි පහක් නැඟීම ඇයට අපහසු වේවි."

වස්යා වත්තට දුවගෙන ගියේය. සුදු පුල්ලියක් නළලෙහි ඇති පැද්දෙන ලී අශ්වයෙකු දෙර ළඟ සිටගෙන සිටිනවා ඔහු දුටුවේය.

ලී අශ්වයා පැද්දෙමින් සිනාසෙමින් සිටියේය.

"එය කෙළේ විජ්ජාකාරයා ද"යි වස්යා ඇසුවේය.

ලී අශ්වයා හිස සැලුවේය.

වස්යා අශ්වයා පපුවට තදකැරගෙන ගෙදර දිවුවේය. ගෙදර දී ඔහු අම්මා සිපගෙන ඇගේ කම්මුල තම නහයෙන් පිරිමැද්දේය.

ඉන් පසු වස්යා ඇඳට ගියේය.

අම්මා විදුලි පහන නිවා දැමුවාය.

ඔහුගේ ඇඳට පිටුපසින් පැද්දෙන ලී අශ්වයා පැද්දෙමින් ද සිනාසෙමින් ද සිටියේය.



ළමා පාඨකයා!
මේ පොතුත් කියවන්න

* ලස්සන වසීලිස්සා	- රුසියානු සුරංගනා කතා	රු. 350/=
* හිම පාරාදීසයේ සතුන් ගැන කතා	- වික්ටර් ඇස්ටාෆිෆ්	රු. 90/=
* නිකිතාගේ ළමා කාලය	- ඇ. තෝල්ස්තෝයි	රු. 180/=
* බලු පැටික්කි	- ඇන්ටන් චේකොෆ්	රු. 80/=
* හනුමන් ගිර	- ගුණසේන විතාන	රු. 125/=
* කැලෑගමේ දඩයක්කාරයා	- ගුණසේන විතාන	රු. 90/=
* හත්පෙති මල	- වලෙන්තින් කතායෙව්	රු. 110/=
* දත්තාගෙයි යාලුවන්ගෙයි හපන්කම් 1	- නිකොලායි නොසෙව්	රු. 190/=
* දත්තාගෙයි යාලුවන්ගෙයි හපන්කම් 2	- නිකොලායි නොසෙව්	රු. 190/=
* දත්තා හඳට යයි	- නිකොලායි නොසෙව්	රු. 140/=

සීමාසහිත කුරුලු පොත් (පෞද්.) සමාගම.
594/1, නාවල පාර,
රාජගිරිය.
දුරකතන : 2863350

අනුවාදය - අනඳපිය කුඩාතිහි

සීමාසහිත කුරුලු පොත් ප්‍රකාශකයෝ (පෞද්.) සමාගම,
594/1, නාවල පාර,
රාජගිරිය.
ඇමතුම් - 0112-863350 / 0777-629787
E-mail- kurulupoth@sltnet.lk

මිල රු. 90.00

955-591-132-0